# දඹුල්ල ලෝක උරුම ක්ෂේත්‍ර ආශ්‍රිත මෑත කාලීන ප්‍රවණතා හා සමකාලීන අවශ්‍යතා

ඒ.එම්.එම්. වීරකෝන්[1]

1980 දශකයේ බිහි වූ ලෝක උරුම ප්‍රාඥප්තියට අනුව කැපී පෙනෙන විශ්වීය අගයන් පදනමින් ලංකාව තුළ සංස්කෘතික හා ස්වාභාවික වශයෙන් වන උරුම ස්ථාන අටක් දැනට ලෝක උරුම ලැයිස්තුවට ඇතුලත් කර තිබේ. අනුරාධපුර පූජා නගරය, පොළොන්නරුව, මහනුවර, සීගිරිය, දඹුල්ල, ගාලු කොටුව, සිංහරාජය හා මධ්‍යම කඳුකරය යනු ඒවාය. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ සංස්කෘතික ලෝක උරුම ආශ්‍රිතව දක්නට ලැබෙන උරුම කළමනාකරණයට පවතින බලපෑම හා එමගින් ඇතිවන ගැටලුකාරි තත්ත්වයන් පිළිබඳව දඹුලු විහාරය ඇසුරින් විමර්ශනයක් කිරීමය. මෙහිදී අධ්‍යයනය සඳහා දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය ලෙස ක්ෂේත්‍ර අධ්‍යයන මෙන්ම පුස්තකාල අධ්‍යයන වැනි ක්‍රමවේදයන් භාවිත කළ අතර එමගින් උරුම ස්ථාන ආශ්‍රිතව පවතින ගැටලුකාරී තත්ත්වයන් හා ප්‍රවණතා පිළිබඳ යම් අදහසක් ලබාදීමට බලාපොරොත්තු වේ. වර්තමානයේ ලෝක උරුම සම්බන්ධයෙන් ඇති ප්‍රධාන ප්‍රවේශයක් වනුයේ ප්‍රජා මූලික සංස්කෘතික භාවිතයන්ට වැඩි ඉඩක් ලබාදෙමින් කළමනාකරණය කිරීමයි. ශ්‍රී ලංකාවේ සීගිරිය ඓතිහාසික ස්ථානයක් ලෙස සංචාරක කර්මාන්තය ආශ්‍රිතව ද, ගාල්ල එහි යුරෝපීය ලක්ෂණ හේතුවෙන් ආකර්ෂණීය සංචාරක කලාපයක් ලෙස ද. මහනුවර හා අනුරාධපුර මහා විහාර සංකීර්ණය ජීවමාන සංස්කෘතික ස්ථාන ලෙස ද සාර්ථක ලෙසින් කළමනාකරණ ක්‍රියාවලිය තුළ ප්‍රජා සහ උරුම කළමනාකරණ ආයතන අතර සම්බන්ධීකරණයකින් ක්‍රියාත්මක වේ. නමුත් සමහර අවශ්‍යතා තුළ දී ලෝක උරුම ප්‍රාඥප්තිය අභිබවමින් ක්‍රියා කිරීමෙන් වර්තමානය වනවිට උරුම ස්ථාන විනාශයට ලක්වීමක් දක්නට ලැබේ. ඇතැම් උරුම ස්ථාන කිසිදු බලපෑමකින් තොරව පාලනය වීමත් තවත් ඒවා ස්ථානීය පරිපාලකයින් සහ වෙනත් නිලධාරීන්ගේ බලපෑමෙන් විනාශයට පැමිණ තිබේ. දඹුලු විහාරය තුළ උරුම කළමනාකරණය පිළිබඳව යම් බලපෑමක් පවතින බව මෙයින් පෙනී යයි. එම පූජනීය ස්ථානය මිනිසුන් නිතර ගැවසෙන ස්ථානයක් වන අතරම සජීවී ආගමික ස්ථානයක් වශයෙන් තාවකාලික අවශ්‍යතා මත දෝලනය වීමත් එමගින් උරුමය විශාල වශයෙන් අභියෝගයට ලක්වීමත් දක්නට ලැබේ. චිත්‍ර, ප්‍රතිමා, අනවශ්‍ය ඉදිකිරීම් මෙන් ම සංරක්ෂණයෙන් තොර වීමත් නිසාවෙන් විනාශයට පත්ව තිබේ. යුනෙස්කෝව විසින් මෙම ස්ථානය ලෝක උරුම ලැයිස්තුවෙන් ඉවත් කිරීම සලකා බැලීමේ තර්ජනයකට ලක්ව පවතී. මෙහිදී යෝජනා කළ හැක්කේ ශ්‍රී ලංකාවේ එවැනි වූ නව ප්‍රවණතාවයන් හටගන්නා ස්ථාන අතර දඹුල්ල ලෙන් විහාරය සුවිශේෂි වන බැවින් එය ප්‍රස්තුත කරගෙන නව ප්‍රාඥප්ති හෝ සමාජ කතිකාවත් ගෙන ඒම තුළින් උරුම කළමනාකරණයේ ප්‍රතිපත්ති සම්පාදනය කළ යුතු බවයි. එනම් උරුම කළමනාකරණය සමකාලීන සමාජ අවශ්‍යතා ඔස්සේ තීරණය වීම නියාමනය කිරීමේ වඩාත් සක්‍රීය හා ප්‍රායෝගික යාන්ත්‍රණයක් අවශ්‍ය බවයි.

ප්‍රමුඛ පද : උරුමය, කළමනාකරණය, ප්‍රවණතා, ගැටළු

---

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. maheshika552@gmail.com